නැගෙනහිර වාලිකාමම් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය.

-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 10 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 අප්‍රේල් 04 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 23 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.3 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව නැගෙනහිර වාලිකාමම් ප්‍රදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිනුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර වාලිකාමම් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

(අ) ආදායම් සහ වගකීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. |
| අඩුවෙන් දැක්වීම් | 02 | 15,200 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 59,436 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.91,482,924 ක් වූ ගනුදෙනු 25 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.829,098 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.2,833 ක් විය.

2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර රු.9,122,541 ක වෙනසක් ද අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.10,706,517 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් වූ අයවැයගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 598 | 637 | 5,146 |
| බදුකුලී | 7,625 | 7,807 | 03 |
| බලපත්‍ර ගාස්තු | 1,650 | 2,351 | - |
| වෙනත් ආදායම් | 41,992 | 31,948 | 38,386 |

2.3.2 ආදායම් අයකිරීම

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.5,182,029 ක් වූ තක්සේරු බදු අයකර ගැනිම සඳහා අර්ථවත් පියවර ගෙන නොතිබුණි. වර්ෂ 05 කට අධික කාලයක් අය නොවී පැවති රු.3,362,977 ක් ඉහත මුදලෙහි ඇතුලත් වි ඇත.

(ආ) සභා බල ප්‍රදේශය තුල පවතින කඩ කාමර 220 ක කුලී සමාලෝචිත වර්ෂය තුල අයකරගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.1,914,521 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි.

(ආ) 2010-2012 කාලපරිච්ඡේදය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු රු.35,067,681 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

----------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------

(අ) පහත සඳහන් විෂයයන් සභා පරිශ්‍රයෙහි නිෂ්ක්‍රීයව තබා තිබුණි.

| විෂයය | සංඛ්‍යාව |
|---|---|
| සෙරෙප්පු | කුට්ටම 21 |
| පිහි | 57 |
| හෝස් පයිප්ප | 108 |
| ස්කෑනර්ස් | 02 |

(ආ) සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව විෂයයන් 68 ක් භාවිතයෙන් තොරව සහ ගර්හිතව ගබඩාවේ තිබුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යාලයේ නම | විෂයයන් සංඛ්‍යාව |
|---|---|
| උරුම්පිරෙයි උප කාර්යාලය | 04 |
| කෝපෙයි උප කාර්යාලය | 02 |
| පුත්තූර් ප්‍රධාන කාර්යාලය | 36 |
| පුත්තූර් උප කාර්යාලය | 10 |
| අච්චුවේලි | 09 |
| නීර්වේලි | 07 |
| | ---------- |
| | 68 |
| | ===== |

2.5 නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය සහ පරිපාලන ) රීති - 111 පරිච්ඡේදයේ 29 වගන්තිය | - | එකතු කරනු ලබන සියළුම ආදායම් දිනපතා බැංකුවෙහි තැන්පත් කළ යුතු වුවද, නීර්වේලි උපකාර්යාලය විසින් 2012.02.04 දින එකතු කළ රු.3,553 ක් වු මුදලක් 2012.03.02 දින දක්වා බැංකුවෙහි තැන්පත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි :- | | |
| මුදල් රෙගුලාසි 571 | - | වර්ෂ 02 කට වඩා කල් ඉකුත් වු රු.3,499.31 ක් වු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 234 | - | මාස 06 කට අධික කාලයක් උපලබ්ධි වී නොතිබුණු රු.4,500 ක් වු අංක 164,250 දරන චෙක්පත සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | - | 2009 - 2012 කාලපරිච්ඡේදය තුල රු.130,005.94 ක් වු එකතු කළ අගය මත බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) 2006 අංක 10 දරන දේශිය ආදායම් බදු පනත | - | 2011 වර්ෂයේදි අයකර ගත් රු.4,336 ක් වු රඳවුම් බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2.6 අවිධිමත් ගෙවීම්

--------------------

අයවැය ලේඛනය සහ අවසන් ගිණුම් පිළියෙල කිරිම සභාවේ සාමාන්‍ය වැඩකටයුතු වුවද, අයවැය ලේඛණය සහ අවසන් ගිණුම් පිළියෙල කිරිම සඳහා නිලධාරින්ට රු.43,916 ක් වූ අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

2.7.1 අනුමත නොකළ ප්‍රාග්ධන වැඩ

---------------------------------

අච්චුවේලි එළවළු වෙළඳ පොළෙහි ප්‍රාග්ධන වැඩ සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මගින් අනුමැතිය දී නොතිබුණු නමුත් එළවළු වෙළඳ පොළෙහි ඉදිකිරිම් කටයුතු සඳහා සභා අරමුදලෙන් රු.1,117,637 ක මුදලක් ගෙවා තිබුණි.

2.7.2 සම්පූර්ණයෙන් අත්හැර දැමූ කාර්යයන්

-------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ශේෂය ලෙස රු.6,908,324 ක් පෙන්නුම් කළ ද සභාවේ අයවැය ලේඛනය මගින් අනුමත කළ රු.3,650,000 ක් වටිනා කාර්යයන් 02 ක් සමාලෝචිත වර්ෂය තුලදී අතහැර දමා තිබුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යය | වෙන්කළ මුදල |
|---|---|
| | රු. |
| ආදාහනාගාරය | 2,000,000 |
| මාර්ග වැඩ | 1,650,000 |
| | 3,650,000 |

2.8 මෙහෙයුම් සහ කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------------------

පළාත් පාලන කොමසාරිස්වරයා විසින් සංවර්ධන කාර්යයන් සඳහා 2010 වර්ෂයේදී දෙන ලද රු.240,674 ක් වූ පරිත්‍යාග මහජනයාගේ සුභසාධනය සඳහා උපයෝජනය නොකොට තැන්පතු ගිනුමෙහි රඳවාගෙන තිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය

------------------------

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති සහ පාලන

----------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) පරිත්‍යාග

(ඇ) විවිධ තැන්පතු

(ඈ) අයවැය පාලනය